# ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 21 සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතන වලට සමාලෝචිත වර්ෂයේදී ලබා දෙන ලද රු.11,847,664 ක් වටිනා පරිගණක සහ ලී බඩු වල වටිනාකම් ගිණුම් ගත කිරීම හෝ හෙළිදරව් කිරීමක් හෝ කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 10,133,440 ක් වූ නොනිම් වැඩ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 1.2.2. ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

රු 7,872,590 ක් වටිනා වසර 5 ට වැඩි ණයහිමි ශේෂ නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

#### 1.2.3. නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි | |
| (i) | මු.රෙ.187 | දෛනික ලැබීම් දිනපතා හෝ හැකිතාක් අප්‍රමාදව බැංකු ගතකල යුතු බව දක්වා තිබුණද ඉන් බැහැරව දෙහිවල උසස් තාක්ෂණ ආයතනයට ලැබෙන මුදල් ලදුපත් වල අනුපිළිවෙලට බැංකු ගත නොකර ඉන් කොටසක් අත රඳවා |

| | | |
|---|---|---|
| | | ගනිමින් බැංකු ගත කර තිබුණි. |
| (ii) | මු.රෙ.260 හා 141(3) (ඇ) | දෙහිවල උසස තාක්ෂණ ආයතනය විසින් චෙක්පතේ සඳහන් වන ආදායකයාගේ නම, මුදල සහ වෙනත් විස්තර වවුචරයේ සඳහන් එකී විස්තර හා සමඟ සැසදිය යුතු වුවත් පුද්ගලයින් 6 දෙනෙකුට රු.14,850 ක මුදලක් චෙක්පත් 2කින් පමණක් ගෙවීම් කර තිබුණි. |
| (iii) | මු.රෙ.264 | සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් මුදල ලැබු බවට ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සියකින් තහවුරුවිය යුතු හා එම කුවිතාන්සිය අදාල වවුචරයේ අමුණා තිබිය යුතු වුවද දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ කිසිදු ගෙවීමක් සඳහා එසේ ලබාගත් කුවිතාන්සි නොතිබුණි. |
| (ආ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | දෙහිවල උසස් තාක්ෂණ ආයතනයෙ සිසුන් ලියාපදිංචි කිරීම ආයතනයේ සමාන්‍ය රාජකාරිය වුවද 2011 වර්ෂයට සිසුන් ලියාපදිංචි කිරීමේදී ඊට සම්බන්ධ නිලධාරීන්ට සිසුන් සංඛ්‍යාව පදනම් කරගෙන රු.14,650ක අනුමැතියකින් තොරව දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | 1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් අනියම් කම්කරුවන් හතරදෙනෙකු උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයට මුදාහැර 2011 වර්ෂය සඳහා රු.416,962 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දින ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතන චක්‍රලේඛ අංක 8<br>3.4 වගන්තිය | දෙහිවල උසස් තාක්ෂණ ආයතනයෙ භාණ්ඩ හා සේවා සපයාගැනීමේදී ලංසු කරුවන් වෙතින් මිල ගණන් ලබාගෙන සැසඳුම් කර භාණ්ඩ මිල දී ගැනීම කළ යුතු වුවද, එකතුව රු.597,026 ක ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම් හා පරිගණක අළුත් වැඩියා කිරීමේදී එසේ සිදුකර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අංක අයිඑ්යු/2008/02 දරණ 2008 ජූනි 24 දිනැති චක්‍රලේඛය | මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාලයෙන් නිකුත් කළ හැකි උපරිම පොත් සංඛ්‍යාව 10 ක් ලෙසත් එම පොත් මසක් ඇතුලත ආපසු භාරදිය යුතු වුවද, එම නියමයන්ගෙන් බැහැරව වැඩි පොත් සංඛ්‍යාවක් නියමිත කාලය ඉක්මවා ආචාර්යවරුන් රදවාගෙන තිබු බව නිරික්ෂණය විය. |

| | | |
|---|---|---|
| (ඊ) | උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2008 ජනවාරි 02 දින නිකුත් කරන ලද අයිඒ/02/15 දරන ලිපිය | අධ්‍යයන කාර්ය මණ්ඩලය නියමිත දේශණ පැය ගණන ආවරණය කල යුතු වුවත් සහකාර දේශකවරුන් 03 දෙනෙකු විසින් මසකට ආවරණය කල යුතු පැය 92 ක කාලය ආවරණය නොකරන බවට නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. තවද 2009 ජනවාරි 02 දිනැති අයි/ඒ/4/5 දරන ලිපිය ප්‍රකාරව කළ වැඩ ලේඛණය නිසි පරිදි නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන හා විදේශ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 423,393,461 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී ඌනතාවය රු.396,653,726 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.321,400,000 ක රජයේ ප්‍රදාන හා විදේශාධාර ලැබීම් රු.907,620 ක් ගණන් ගැනීමෙන් පසු ඌනතාවය රු.101,085,841 ක් වූ අතර ඉකුත් වර්ෂයේ රු.304,317,000 ක් වූ රජයේ ප්‍රදාන හා විදේශ ආධාර ලැබීම් රු4,526,813 ගණන් ගැනීමෙන් පසු ඌනතාවය රු.87,809,913 ක් වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේ වියදම රු.25,816,537 කින් ඉහළ ගොස් තිබුණු නමුත් ආදායම රු.923,197 කින් අඩුවී තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය (රජයේ ප්‍රදාන හා විදේශ ආධාර ගැලපීමට පෙර) රු.26,739,735 කින් වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශිෂ්‍ය ලියාපදිංචි සංඛ්‍යාවේ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමේදී පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍ය ලියාපදිංචිය 17% කින් වැඩි වී තිබුණි.

| පාඨමාලාව | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| ගණකාධිකරණ උසස් ජාතික ඩිප්ලෝමාව | 1420 | 1389 | 1402 | 1502 | 1408 |
| කළමනාකරණ උසස් ජාතික ඩිප්ලෝමාව | 232 | 333 | 451 | 419 | 424 |
| උසස් ජාතික ඉන්ජිනේරු ඩිප්ලෝමාව | 200 | 206 | 221 | 245 | 431 |
| තාක්ෂණ (කෘෂි) උසස් ජාතික ඩිප්ලෝමාව | 69 | 92 | 142 | 139 | 168 |
| ඉංග්‍රීසි උසස් ජාතික ඩිප්ලෝමාව | 570 | 757 | 989 | 989 | 1344 |
| ව්‍යාපාර අධ්‍යයන උසස් ජාතික ඩිප්ලෝමාව | 97 | 155 | 142 | 180 | 147 |
| ව්‍යාපාර මූල්‍යකරණ උසස් ජාතික ඩිප්ලෝමාව | 32 | 30 | 48 | 64 | 46 |
| තොරතුරු තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමාව | 271 | 304 | 367 | 385 | 448 |
| ව්‍යාපාර පරිපාලන උසස් ජාතික ඩිප්ලෝමාව | - | - | - | - | 163 |
| එකතුව | 2891 | 3266 | 3762 | 3923 | 4579 |
| පූර්ව වර්ෂයට සාපේක්ෂව වෙනස්වීමේ ප්‍රතිශතය | (20%) | (13%) | 15% | 4% | 17% |

(ආ) **පාඨමාලා හඳුන්වා දීම**

උසස් තාක්ෂණ ආයතනය පිහිටුවීමේ ඉලක්ක හා අරමුණු අතර පාඨමාලාවල විවිධත්වයක් ඇති කිරීම, නව පාඨමාලා හඳුන්වා දීම හා ගාස්තු අය කරන පාඨමාලා හඳුන්වා දීම ආදිය ඇතුලත් වුවද මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනය මගින් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අදාල පාඨමාලාවන් පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යටතේ ඇති ආයතන හතකට අදාල ඉඩම් හා ගොඩනැගිලි වල නීත්‍යානුකූල අයිතිය මේ දක්වා උසස් තාක්ෂණ ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ 2010 ජනවාරි සිට 2011 ජුලි 31 දින දක්වා කාල පරිච්ඡේදය තුල ලදුපත් වලින් අයවී තිබූ රු. 23,119 ක මුදලක් බැංකු ගත කර නොතිබුණි.

(ඇ) මහපොළ ශිෂ්‍යාධාර භාරනොගත් ශිෂ්‍යයන්ට අදාල ශිෂ්‍යාධාර බැංකුගත කර එම මුදල් සඳහා මහපොළ අරමුදල වෙත චෙක්පත් නිකුත් කලයුතු වුවත් එසේ ශිෂ්‍යයින් විසින් භාර නොගත් එකතුව

රු520,000 ක් බැංකු ගත නොකර මසකට ආසන්න කාලයක් රඳවා ගෙන එම වටිනාකමට අදාල චෙක්පත් නිකුත් කර තිබූ අවස්ථා හතරක් නිරීක්ෂණය විය.

## 3.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

මට්ටක්කුලය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ වර්ග 22ක් නුසුදුසු ඒවා ලෙස වෙන් කර ලැයිස්තු ගත කොට තිබූ අතර අපහරණය කිරීමට පියවර නොගෙන වසර කිහිපයක් තිස්සේ වැඩහල් කාමර තුළ තබා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### වාර්ෂික වාර්තා සභාගත කිරීම

2009 හා 2010 වර්ෂ වලට අදාල ආයතනයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ඉන්වෙන්ට්‍රි පාලනය

(ආ) ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීම හා ගිණුම් ගත කිරීම

(ඇ) උසස් තාක්ෂණික ආයතනවල මුදල් පිළිබඳ අභ්‍යන්තර පාලනය